11. සිගරට් සඳහා ඇති ඉල්ලුමේ මිල නම්‍යතාව 1 ට වඩා අඩු ය'යි සලකන්න. සිගරට් නිෂ්පාදනය මත දේශීය භාණ්ඩ බද්දක් පනවනු ලැබූ විට, භාණ්ඩයේ මිල, ප්‍රමාණය හා පාරිභෝගික පැහැදම වෙනස් වනුයේ පහත සඳහන් කවර ආකාරයට ද?

| | මිල | ප්‍රමාණය | පාරිභෝගික පැහැදම |
|---|---|---|---|
| (1) | අඩු වේ. | වැඩි වේ. | වැඩි වේ. |
| (2) | අඩු වේ. | අඩු වේ. | අඩු වේ. |
| (3) | වැඩි වේ. | අඩු වේ. | අඩු වේ. |
| (4) | වැඩි වේ. | අඩු වේ. | වැඩි වේ. |
| (5) | වැඩි වේ. | වැඩි වේ. | වැඩි වේ. |

12. දිවා සුරැකුම් මධ්‍යස්ථාන වෙත යොමු කෙරෙන දරුවන් වෙනුවෙන් වැය කිරීමට සිදුවන පිරිවැය ආවරණය කරගනු වස් රජය විසින් සෑම දෙමව්පියෙකුට ම එක් එක් දරුවා වෙනුවෙන් සහනාධාර කූපන් පතක් දෙනු ලැබේ යැ'යි සලකන්න. මේ නිසා දිවා සුරැකුම් සේවා සැපයුම් වෙළෙඳපොළෙහි කෙබඳු වෙනසක් ඇති විය හැකි ද?
   (1) දිවා සුරැකුම් සේවා සඳහා ඉල්ලුම අඩු වන අතර මිල පහළ බසී.
   (2) දිවා සුරැකුම් සේවා සඳහා ඉල්ලුම වැඩි වන අතර මිල ඉහළ නගී.
   (3) දිවා සුරැකුම් සේවා සැපයුම වැඩි වන අතර මිල පහළ බසී.
   (4) දිවා සුරැකුම් සේවා සැපයුම අඩු වන අතර මිල ඉහළ නගී.
   (5) දිවා සුරැකුම් සේවා සැපයුමේ හිඟයක් දිගින් දිගට ම හට ගනී.

13. පාරිභෝගික අතිරික්තය ශූන්‍ය අගයක් ගැනීමට අවශ්‍ය කරන කොන්දේසිය වනුයේ
   (1) ඉල්ලුම පූර්ණ මිල නම්‍යතාවෙන් යුක්ත වීම ය.
   (2) ඉල්ලුම පූර්ණ මිල අනම්‍යතාවෙන් යුක්ත වීම ය.
   (3) සැපයුම පූර්ණ මිල නම්‍යතාවෙන් යුක්ත වීම ය.
   (4) සැපයුම පූර්ණ මිල අනම්‍යතාවෙන් යුක්ත වීම ය.
   (5) ඉල්ලුමේ මිල නම්‍යතාව සාපේක්ෂ වශයෙන් සැපයුමේ මිල නම්‍යතාවට වඩා ඉහළ අගයක් ගැනීම ය.

14. 'සාමාන්‍ය භාණ්ඩයක්' සඳහා වන වෙළෙඳපොළක, අලෙවි කරනු ලබන භාණ්ඩ ඒකක ප්‍රමාණයත්, මිලත් යන දෙක ම එකවර ඉහළ යාම පැහැදිලි කළ හැක්කේ පහත සඳහන් ද අතුරෙන් කවරක් මගින් ද?
   (1) එම භාණ්ඩය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද සඵල උපරිම මිල ප්‍රතිපත්තිය ඉවත් කර දැමීම
   (2) භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ දී හට ගත් තාක්ෂණික දියුණුව
   (3) භාණ්ඩය මත බද්දක් පැනවීම
   (4) එම භාණ්ඩයේ නිෂ්පාදකයනට සහනාධාරයක් ලබා දීම
   (5) එම භාණ්ඩය සඳහා ඇති ආදේශක භාණ්ඩයක මිල පහළ යාම

15. ශ්‍රමයේ ආන්තික ඵලදාව, ශ්‍රමයේ සාමාන්‍ය ඵලදාවට සමාන වන විට
   (1) ශ්‍රමයේ ආන්තික ඵලදාව උපරිම වේ.
   (2) නිෂ්පාදනයේ ආන්තික පිරිවැය අවම වේ.
   (3) නිෂ්පාදනයේ ආන්තික පිරිවැය අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වේ.
   (4) සාමාන්‍ය මුළු පිරිවැය, අවම අගයක් ගනී.
   (5) ශ්‍රමයේ මුළු ඵලදාව උපරිම වේ.

16. කිසියම් නිෂ්පාදන ආයතනයක ශ්‍රම හමුදාවේ ප්‍රමාණය දිනකට ශ්‍රමිකයින් 100 සිට 101 දක්වා වැඩි කරන විට, ශ්‍රමිකයෙකුගේ දෛනික වැටුප ද රු. 600 සිට රු. 650 දක්වා ඉහළ නැංවීමට නිෂ්පාදන ආයතනයට සිදු වේ. මේ අනුව එක් දිනක දී ශ්‍රමයේ ආන්තික පිරිවැය කොපමණ වේ ද?
   (1) රු. 50 කි. (2) රු. 650 කි. (3) රු. 5 650 කි. (4) රු. 60 000 කි. (5) රු. 65 650 කි.

17. කිසියම් නිෂ්පාදන ආයතනයක වාර්ෂික නිෂ්පාදන පිරිවැය ආර්ථික විද්‍යාඥයෙකු විසින් ගණනය කොට, පහත සඳහන් ආකාරයට ඉදිරිපත් කර ඇත.

| අයිතමය | පිරිවැය (රු.දහස් ගණනින්) |
|---|---|
| වැටුප් සහ වේතන | 150 |
| අයිතිකරුවාගේ කාලයෙහි ආවස්ථික පිරිවැය | 40 |
| ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා පිරිවැය | 80 |
| බදු කුලිය | 30 |
| අලෙවිකරණ පිරිවැය | 20 |
| බැංකු ණය සඳහා පොලී ගෙවීම් | 25 |
| අයිතිකරුවා ම යොදන ලද ප්‍රාග්ධනයෙහි අහිමි වුණු පොලී ආදායම් | 15 |

මෙම තොරතුරුවලට අනුව ආර්ථික විද්‍යාඥයෙකු විසින් නිර්වචනය කරනු ලබන මුළු පිරිවැය, ගණකාධිකාරීවරයෙකු විසින් නිර්වචනය කරනු ලබන මුළු පිරිවැයට වඩා කොතරම් ප්‍රමාණයකින් ඉක්මවා යනු ලැබේ ද?
   (1) රු. 30 500 යි. (2) රු. 55 000 යි. (3) රු. 85 000 යි.
   (4) රු. 305 000 යි. (5) රු. 360 000 යි.

